අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/10/01/01/28/152 -II  ඔබේ යොමුව / உமது இல. / Your Ref.  දිනය / திகதி / Date 2017.12.29

චක්‍රලේඛ අංක :47/2017

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් කළමනාකරුවන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්,

**<u>ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුවරුන් සඳහා 2017 අයවැය මගින් යෝජිත ආපදා ණය වරප්‍රසාදය ලබා දීම.</u>**

ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කරගෙන රජයේ සේවකයින් වෙත ලබාදෙනු ලබන ආපදා ණය වරප්‍රසාදය, ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුභවතුන් ***(මින් මතු " ගුරුභවතා " යනුවෙන් හඳුන්වනුයේ රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසලක අනුමත පත්වීම්ධාරී ගුරුවරයා වේ)*** අභිප්‍රේරණය කිරීම සඳහා ලබා දීමට 2017 අයවැය මගින් යෝජනා කර ඇත. ඒ අනුව ආපදා ණය යෝජනා ක්‍රමයේ විධිවිධාන පිළිබඳ උපදෙස් ලබාදීම, මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂා කෙරේ.

**02.** මෙම ආපදා ණය ඉල්ලීමේ සත්‍යතාවය සහ ගුරුභවතාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණු නිසා මුදල් අපහසුකම් ඇති වූ බව ඔප්පු කිරීමට ඉල්ලුම්කරු විසින් සිය අවංකභාවයෙන්ම කරනු ලබන ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ නම් පහත අංක 03 හි සඳහන් ඕනෑම කාර්යයක් සඳහා මෙම ආපදා ණය ලබා දිය හැකිය.

**03.** ආපදා ණය ලබා දිය හැකි කාර්යයන්

3.1 ගිනි, ගංවතුර හෝ එවැනි වෙනත් ස්වාභාවික විපත් නිසා සිදුවන ආපදාවලදී සහනය සැලසීම.

3.2 වෛද්‍ය වියදම්, රෝහල් ගාස්තු හෝ සාත්තු සේවක ගාස්තු.

3.3 ගුරුභවතාගේ පවුලේ කෙනෙකුගේ අසනීපයක් නිසා ණය ගැති වීම.

3.4 ගුරුභවතාගේ පවුලේ කෙනෙකුගේ අසනීපයකට වියදම් කිරීම හේතුවෙන් ගෙවල් කුලී ගෙවීමට නොහැකි වීම නිසා කුලී හිඟ හිටීම.

3.5 ගුරුභවතාගේ පවුලේ කෙනෙකුගේ අවමංගල්‍යයක් සඳහා වන වියදම්.

3.6 ගුරුභවතාගේ හෝ ඔහුගේ පවුලේ අය පදිංචිව සිටින්නාවූ ද, ගුරුභවතාගේ හෝ ඔහුගේ කලත්‍රයාට අයිතිවූ ද නිවාසයක අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා.

3.7 ඩෙංගු , බරවා, මැලේරියා රෝගවලින් ආරක්ෂා වීමට මදුරු දැල් මිලදී ගැනීම

3.8 තමාගෙන් යැපෙන දරුවෙකුට (ගණිත උපකරණ, සර්පණ රූල්, කිරුම් පඩි පෙට්ටි ආදිය ඇතුළු) පාසැල් පොත් මිලදී ගැනීම.

3.9 ගුරුභවතාට වහාම පදිංචිවීම සඳහා ගෙයක් කුලියට ගැනීමේදී ගෙවිය යුතු මුල් ගෙවල් කුලී අත්තිකාරම්.

3.10 ගුරුභවතා ඉල්ලුම් කර ඇති නිවාස ණයක් සම්බන්ධයෙන් රජයේ ආයතනයකට ගෙවිය යුතු වියදම්.

3.11 පරිගණක යන්ත්‍ර හා අවශ්‍ය උපාංග මිලදී ගැනීම.

3.12 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ මතය පරිදි ආපදා ණය ලබා දීමට සුදුසු විය හැකි වෙනත් කරුණු.

- මේ වගන්තිය යටතේ ගුරුභවතාගේ පවුල යන්නට, කලත්‍රයා හා දරුවන්ට අමතරව ගුරුභවතාගෙන් යැපෙන්නේ නම් ගුරුභවතාගේ දෙමව්පියෝ ද, කලත්‍රයාගේ දෙමාපියෝද , අවිවාහක සොහොයුරියෝ ද, වයස අවුරුදු 18 ට අඩු සොහොයුරෝ ද අදහස් කෙරේ.

**04.** සුදුසුකම

මෙම වරප්‍රසාදය හිමිවන්නේ ආධාර ලබන රජයේ අනුමත, පෞද්ගලික පාසල්වල අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අනුමත ගුරුවරයෙකු වශයෙන් විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබාගෙන, රජයෙන් වැටුප් ආධාර ලබන ගුරුවරුන් පමණි. රජයෙන් වැටුප් ආධාර නොලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල, අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් මෙම වරප්‍රසාදය සඳහා හිමිකම නොලබයි.

**05.** ණය ප්‍රමාණය

5.1 ගුරුභවතාගේ මාසික ඒකාබද්ධ වැටුපේ දසගුණයක් හෝ රු 2,50,000/= ක් හෝ යන මුදල් දෙකෙන් අඩු මුදල, ආපදා ණය මුදල ලෙස ඉල්ලුම් කිරීමට හිමිකම ඇත.

5.2 ගෙවල් කුලී අත්තිකාරම් ගෙවීම සඳහා වූ ණයක් සම්බන්ධයෙන් වූ කළ එම මුදල කිසිදු අවස්ථාවකදී මාස තුනක අනුමත ගෙවල් කුලිය නොඉක්මවිය යුතුය.

**06.** පොළිය

6.1 ඉහත 5.1 වගන්තියේ සඳහන් උපරිමයකට යටත්ව ලබාගන්නා ණය මුදල් වෙනුවෙන් ගුරුභවතාගෙන් 4% ක වාර්ෂික පොළියක් අය කරනු ලැබේ.

6.2 ලබා ගන්නා ණය සඳහා බැංකු පොළී අනුපාතිකය සහ ගුරුභවතාගෙන් අය කරන 4% ක පොළී අනුපාතිකය අතර වෙනස රජය විසින් දරනු ඇත.

6.3 පොළිය ගණනය කරනු ලබන්නේ හීන වන ණය ශේෂය පදනම් කර ගනිමිනි.

6.4 ගුරුභවතාගෙන් අය කර ගනු ලබන ණය වාරිකය හා ඉහත 6.3 අනුව ගණනය කරන ලද 4 % ක පොළිය ඇතුළත් මාසික වාරිකය මුළු ණය මුදල ගෙවා අවසන් වන තෙක් සමාන වාරික ලෙස අය කළ යුතුය.

**07.** ඇපකරුවෝ

සේවා කාලය අවුරුදු 10 ට අඩු පාඨශාලා විශ්‍රාම වැටුප් හිමි ගුරුභවතුන් සම්බන්ධයෙන් අවුරුදු 10 ට නොඅඩු සේවා කාලයක් ඇති විශ්‍රාම වැටුප් /දායක විශ්‍රාම වැටුප් හිමි එක් ඇපකරුවෙකු හෝ අවුරුදු 05 ට නොඅඩු සේවා කාලයක් ඇති රජයේ විශ්‍රාම වැටුප් /පාඨශාලා දායක විශ්‍රාම වැටුප් හිමි ඇපකරුවන් දෙදෙනෙකු හෝ ඉදිරිපත් කළ යුතු ය. අවුරුදු 10 ට වැඩි සේවා කාලයක් ඇති විශ්‍රාම වැටුප් හිමි ගුරුභවතුන් සඳහා අවුරුදු 05 ට නොඅඩු සේවා කාලයක් ඇති විශ්‍රාම වැටුප් /දායක විශ්‍රාම වැටුප් හිමි එක් ඇපකරුවෙකු ඉදිරිපත්කිරීම ප්‍රමාණවත් වේ.

08. ආපදා ණය ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න මාස හය තුළ මෙම ගණයේ ණයක් ලබාගෙන නැත්නම් , ඕනෑම අවස්ථාවක ආපදා ණයක් දිය හැකි ය. කිසිදු අවස්ථාවක එසේ පසුව ලබා ගන්නා ණය, 05 වගන්තිය යටතේ ගුරුභවතාට හිමිකම් ඇති මුදල සහ මෙම ගණය යටතේ කලින් ලබාගෙන ඇති ණය මුදල්වල ආපසු ගෙවීමට ඇති ශේෂය යන දෙක අතර වෙනසට වඩා වැඩි නොවිය යුතු ය.

8.1 මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාව , මාසික වැටුපෙන් 40% කට වැඩි නොවිය යුතු ය. (මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව යනු , ණය වාරික වෙනුවෙන් ඇමුණුම 1 හි සඳහන් වන අඩු කිරීම් හැර වෙනත් අඩු කිරීම් වෙනුවෙන් යම් ගුරුභවතෙකුගේ පඩි ලැයිස්තුවෙන් මාසයකදී අඩු කරගනු ලබන මුළු මුදල වේ.) මේ සීමාවන් ඉක්මවා යන පරිදි ණය මුදලක් නොදිය යුතුය

8.2 රුපියලකින් කොටසක් අය කර ගැනීමට සිදුවීම වැළැක්වීම සඳහා ආපසු අය කර ගන්නා මාසික වාරිකය ගණන් බැලීමේදී , වාරිකය ආසන්නම රුපියලට ගණන් බැලිය යුතු ය. රුපියලකින් කොටසක් අය කර ගත යුතු නම්, එය පළමුවන වාරිකයෙන් අය කර ගත යුතු ය.

## 09 . ණය වාරික අය කිරීම හා ප්‍රේෂණය කිරීම

9.1 ගුරුභවතා සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය විසින් බැංකුවේ නිර්දේශිත ණය වාරික මුදල, ගුරුභවතාගේ වැටුපෙන් අඩු කරනු ලබන පොළිය හා රජය විසින් දරණ පොළිය අදාළ බැංකුව වෙත මාසිකව ප්‍රේෂණය කළ යුතුය.

9.2 ගුරුභවතා වෙනුවෙන් රජය විසින් දරනු ලබන පොළී ප්‍රමාණය රජයේ වියදමක් ලෙස භාණ්ඩාගාරයේ උපදෙස් මත ගිණුම් තැබිය යුතුය.

9.3 ගුරුභවතෙකු ලබා ගන්නා ආපදා ණය සම්බන්ධයෙන් වැඩි මුදලක් ආපසු ගෙවීම ඔහුගේ කැමැත්ත පරිදි කළ හැකිය.

## 10. හිඟ ණය වාරික.

10.1 කිසියම් හේතුවක් නිසා ගුරුභවතාට වැටුප් නොගෙවන අවස්ථාවකදී ණය වාරික අය නොකිරීම පිළිබඳව අදාළ බැංකුව වෙත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නොපමාව දැනුම් දිය යුතුය.

10.2 සේවයෙන් ඉවත්වීමකදී සේවය අතහැර යාමකදී, සේවයෙන් පහකිරීමකදී හෝ සේවය අවසන් කිරීමකදී ණය ශේෂය සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

10.3 වැඩ තහනම් කිරීමකදී/ සේවයෙන් පහකිරීමකදී/ සේවය අතහැර යාමකදී/ සේවය අවසන් කිරීමකදී/සේවයෙන් විශ්‍රාම යෑමේදී ණය වාරික අදාළ ණය ඉල්ලුම්කරු විසින් බැංකුවේ නීති රෙගුලාසිවලට අනුකූලව රජය විසින් දරන පොළියේ වෙනසද ඇතුළුව පෞද්ගලිකව අදාළ බැංකුව වෙත ගෙවිය යුතුය.

10.4 වැඩ තහනම් කළ ගුරුභවතෙකු නැවත සේවයේ පිහිටුවහොත් වැඩ තහනම් කරන ලද කාලය තුළ ගුරුභවතා විසින් ගෙවන ලද ණය වාරිකවලට අදාළව රජය විසින් දරන පොළිය පහත සඳහන් කොන්දේසිවලට යටත් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

10.4.1 ගුරුභවතාගේ වරදක් නොමැති බව දක්වමින් ඔහු/ඇය නැවත සේවයේ පිහිටුවහොත් ඔහු/ඇය විසින් ගෙවන ලද ණය වාරිකවල ඇතුළත්, රජය විසින් දරනු ලබන පොළිය සම්පූර්ණයෙන් ඔහු වෙත ප්‍රතිපූර්ණය කළ යුතු වේ.

10.4.2 ගුරුභවතා නැවත සේවයේ පිහිටුවන ලද්දේ යම් කිසි දඬුවමකට යටත්ව නම් දඬුවමේ ස්වාභාවය නොසලකා ගෙවන ලද වාරිකවල ඇතුළත් රජය විසින් දරනු ලබන පොළී ප්‍රමාණයෙන් අඩක් පමණක් ප්‍රතිපූර්ණය කළ යුතු වේ.

10.4.3 අනිවාර්ය නිවාඩු ගන්වා ඇති ගුරුභවතෙකු සම්බන්ධ ණය වාරික හා පොළිය සාමාන්‍ය පරිදී බැංකුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර, රජය විසින් පොළියේ වෙනස දරනු ලැබේ.

10.4.4 යම්කිසි ගුරුභවතෙකුට අඩ වැටුප් ගෙවන අවස්ථාවලදී ණය වාරික හා පොළිය අය කිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

10.4.5 එසේ වුවත් රජයේ අනුමත පත්වීම්ධාරී පෞද්ගලික පාසල් ගුරුවරියක ප්‍රසූත නිවාඩු මත අර්ධ වැටුප් හෝ වැටුප් රහිත නිවාඩු ලබන අවස්ථාවකදී ණය වැටුප් වාරිකය හා පොළිය පෞද්ගලිකව බැංකුව වෙත ගෙවිය යුතු අතර, පොළියේ වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

10.4.6 ගුරුභවතෙකු වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී ණය වාරික හා පොළිය අයකිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

10.4.7 සේවා කාලය තුළදී ගුරුභවතෙකු මිය ගියේ නම් හෝ පූර්ණ අකර්මන්‍යතාවයකට පත්වූයේ නම් හෝ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද්දේ නම්, එදින සිට රජය විසින් දරනු ලබන පොළියේ වෙනස දරනු නොලබන අතර, බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

10.4.8 යම් කිසි හේතුවක් නිසා ගුරුභවතෙකු සිය දිවි හානිකරගෙන ඇත්නම් අදාළ ණය මුදල් අය කර ගැනීම සම්බන්ධව බැංකුවේ නීතිරීති අනුගමනය කළ යුතුය.

## 11. ණය ඉල්ලුම්පත් පෙරසැරි කිරීමේ ගාස්තු

11.1 නිර්දේශිත බැංකුවකින් ආපදා ණය ලබා ගැනීමට යාමේදී ඉදිරිපත් කළ යුතු යැයි බැංකුව නිර්දේශ කරන ලිය කියවිලි වෙනුවෙන් නියම කරනු ලබන ගාස්තු ණය ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතුයි.

11.2 ඉහත අංක 11.1 වගන්තියේ සඳහන් ගුරුභවතා ගෙවිය යුතු අවම මුදල ඔහුගේ/ඇයගේ මනාපය අනුව මුදලින් ගෙවීමට හෝ ණය මුදල වෙනුවෙන් ගෙවනු ලබන පළමු වාරිකයෙන් අඩු කිරීමට හෝ ණය මුදලේ මාසික වාරික මුදලට ඇතුළත් කොට හෝ අය කර ගැනීමට කටයුතු කළ හැකිය.

## 12. ආපදා ණය ලබාදීමේ සාමාන්‍ය කොන්දේසි

12.1 රජය විසින් දරන පොළිය මත ගුරුභවතෙකුට ලබා දිය යුතු ණය මුදල තීරණය කිරීමේදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

12.1.1 ණය මුදල නිර්දේශ කිරීමේදී නොසැලකිලිමත්කම හේතුවෙන් ඇතිවන ගැටළුවලදී සහ රජයට සිදුවන අලාභයන්හීදී ණය මුදල නිර්දේශ කළ නිලධරයාට විරුද්ධව කටයුතු කිරීමට පියවර ගන්නා අතර, අලාභය එම නිලධරයාගෙන් අය කරනු ඇත.

12.1.2 බැංකුව උපරිම ණය මුදල අනුමත කිරීමේදී ගුරුභවතාගේ දීමනා හැර මාසික ශුද්ධ වැටුපෙන් ණය මුදලේ වාරිකය හා ගුරුභවතාගෙන් අය කරනු ලබන පොළිය යන කොටස් දෙකම අඩු කිරීමට හැකි වන ආකාරයට වාරිකය තීරණය කළ යුතු වේ.

12.1.3 යම් කිසි ගුරුභවතෙකු ණය ලබා ගන්නා විට සේවය කළ පාසලින් ඉල්ලා අස්වුවහොත්, බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය අදාළ ගුරුභවතාගේ ආපදා ණය පොළිය ගෙවීම පිළිබඳව වගකීම දරනුයේ ඔවුන් ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසලක ගුරුභවතෙකු වශයෙන් සේවයේ යෙදී සිටින තුරු පමණි.

12.1.4 ණය ලබා දීමට බැංකුව වෙත නිර්දේශයක් ලද ගුරුභවතෙකු එම ණය මුදල ලබා ගැනීමට පෙර වැඩ තහනමකට හෝ සේවයෙන් පහ කරනු ලැබුවහොත් හෝ අනිවාර්ය නිවාඩු යවනු ලැබුවහොත්, එවැනි තත්ත්වයන් බැංකුවෙන් ණය මුදල ලබා දීමට පෙර බැංකුව වෙත නොපමාව වාර්තා කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ. එබැවින් එවැනි තත්ත්වයන් උද්ගත වුවහොත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වහාම ලිඛිතව දැනුවත් කිරීමට අදාළ පාසලේ කළමනාකරු වගබලා ගත යුතු වේ. එසේම යම් කිසි අනුමත ගුරුභවතෙකු වැටුප් රහිත හෝ අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන සිටින විට ඒ බව පාසලේ විදුහල්පති මඟින් කළමනාකරුට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නොපමාව ලිඛිතව දැනුම් දිය යුතුය.

12.2 ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලත් ගුරුභවතෙකු වෙනුවෙන් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් බැංකුව වෙත ලබා දෙන නිර්දේශය ප්‍රමාද වන්නේ නම් හෝ බැංකුවකින් ණය ලබා ගැනීමට අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන්නේ නම්, ඒ බව ලිඛිතව භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

12.3 ආපදා ණය ආපසු ගෙවීමේ උපරිම කාලය මාස 60 කි. වාරික 06 ක් ගෙවීමෙන් පසු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය මත පවත්නා ණය ශේෂය මත පදනම්ව ඉහත 8 හා 12.2 වගන්තිවල සඳහන් සීමාවලට යටත්ව නැවත ණය මුදලක් සඳහා සලකා බැලිය හැක.

**13. ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම , නිර්දේශ කිරීම හා අදාළ මුදල අය කිරීමේ ක්‍රියා පරිපාටිය.**

13.1 ණය ඉල්ලුම්කරුවකු විසින් ඇමුණුම 02 අනුව අයදුම්පත්‍රය පිටපත් 2කින් පිළියෙළ කර, ණය ලබා ගැනීමට අපේක්ෂිත බැංකුවෙන් (13.5 හි සඳහන් කර ඇති ) නිකුත් කරන ලද හා නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමග ඇමුණුම 03 අනුව අදාළ ලියවිලි කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

13.2 කලාප අධ්‍යාපන කාර්යාලය විසින් අදාළ ණය ඉල්ලුම්පත්‍රය ලේඛනයකට ඇතුළත් කර, ඉහත 8 හා 12.2 වගන්ති අනුව ලබාදිය හැකි ණය මුදල තීරණය කොට ණය ඉල්ලුම්කරුගේ කැමැත්ත ලබා දී ඇති බැංකුව වෙත සතියක් ඇතුළත නිර්දේශිත ණය ඉල්ලුම්පත්‍රය යොමු කිරීමට කටයුතු කළ යුතුය.

13.3 ණය ඉල්ලුම්කරු විසින් අදාළ ණය මුදල ලබා ගැනීම සඳහා එම බැංකුවේ නීතිරීතිවලට එකඟව හා චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව අවශ්‍ය තොරතුරු මාස තුනක් සම්පූර්ණ වීමට පෙර බැංකුව වෙත සපයා ණය මුදල අනුමත කිරීමෙන් අනතුරුව, ඇමුණුම 04 අනුව බැංකුව මඟින් කලාප අධ්‍යාපන කාර්යාලය/ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය.

13.4 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් බැංකුවක් වෙත නිර්දේශ කරන ලද ණය ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීම් බැංකුවට අවශ්‍ය වන අවස්ථාවන් හිදී ගුරුභවතා විසින් එම පැහැදිලි කිරීම් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම පැහැදිලි කිරීම් මාස 3ක් ඇතුළත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එවැනි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. කිසිදු හේතුවකින් මෙම කාලය දීර්ඝ කිරීමක් සිදු නොකරනු ලබන අතර එවැනි ඉල්ලීම් නව ඉල්ලීමක් ලෙස පොරොත්තු ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

13.5 පහත සඳහන් කර ඇති රාජ්‍ය බැංකුවලින් පමණක් ණය ලබා ගත හැක.

- මහජන බැංකුව
- ලංකා බැංකුව
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

14. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරනු ලබන අතර, ඊට අදාළ විධිවිධාන 2017.12.29 දින සිට බල පැවැත්වේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

| | | |
|---|---|---|
| 1. ලේකම් | - | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 2. ලේකම් | - | මුදල් අමාත්‍යාංශය |
| 3. ලේකම් | - | මහා භාණ්ඩාගාරය |
| 4. ලේකම් | - | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| 5. අධ්‍යක්ෂ ජනරාල් | - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| 6. අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) | - | අධ්‍යාපන අමාත්‍යාංශය |

ඇමුණුම 1

<u>වැටුප් ලැයිස්තුවෙන් අඩු කර ගැනීමට ඉඩ දී ඇති සීමාව ගණන් බැලීමේ දී සැලකිල්ලට නොගත යුතු මාසික අඩු කිරීම්</u>

- වැන්දඹු /වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අවකරණ.
- ආදායම් බද්ද.
- ජීවිත රක්ෂණ සහතික වෙනුවෙන් වාරික .
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අය විය යුතු රක්ෂණ වාරික.
- ආණ්ඩුවට කරන පරිත්‍යාග.
- නිවාසයක් තැනීම සඳහා ඉඩමක් හෝ නිවාස දේපළක් හෝ අත්කර ගැනීම සඳහා ලබා ගන්නා ණය.
- නිවාස ඉදි කිරීම/ වැඩ අවසන් කිරීම සඳහා ලබාගන්නා ණය.

ඇමුණුම 02

**රජයේ අනුමත පත්වීම්ධාරී පෞද්ගලික පාසල් ගුරුභවතෙකු ණය ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රය.**

01.

i) මුලකුරු සමග නම:......................................................................................................
.........................................................................................මහතා/මහත්මිය/මෙනවිය

ii) මුලකුරුවලින් කියවෙන නම් :...............................................................................
..............................................................................................................................

iii) ස්ථිර ලිපිනය:..........................................................................................................

iv) දුරකථන අංක (නිවස) ....................(ජංගම ):..................(රාජකාරී) :.....................

v) විවාහක/අවිවාහක බව :.......................................................................................

vi) උපන් දිනය හා ස්ථානය :...................................................................................

vii) ජාතික හැඳුනුම්පත් අංකය :................................................................................

viii) රාජකාරී ස්ථානය:.................................................................................................

ix) තනතුර :.................................................................................................................

x) රජයේ අනුමත පත්වීම්ධාරී ගුරුවරයෙකු ලෙස සේවා කාලය :..................................

02.

i) කලත්‍රයාගේ සම්පූර්ණ නම :....................................................................................
..............................................................................................................................

ii) උපන් දිනය හා ස්ථානය :.......................................................................................

iii) ජාතික හැඳුන්ම්පත් අංකය :...................................................................................

iv) දුරකථන අංක (ජංගම ):......................... (රාජකාරී) :.................................

v) රාජකාරී ස්ථානය:.....................................................................................................

vi) රාජකාරී ලිපිනය:....................................................................................................

vii) තනතුර :.................................................................................................................

viii) තනතුරේ සේවා කාලය :........................................................................................

03. යැපෙන්නන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ වයස් : .................................................
..............................................................................................................................
..............................................................................................................................

04. ණය අයදුම් කරන කාර්යය : (47/2017 චක්‍රලේඛයේ 03 වගන්තිය අනුව)
..............................................................................................................................
..............................................................................................................................

05. ණය මුදලේ ප්‍රමාණය : රු. ....................................ආපසු ගෙවන කාලය :.....................

06. ඇපකරුගේ විස්තර

i) මුලකුරු සමග නම:......................................................................................................
.........................................................................................මහතා/මහත්මිය/මෙනවිය

ii) මුලකුරුවලින් කියවෙන නම් :...............................................................................
..............................................................................................................................

iii) ස්ථිර ලිපිනය :.........................................................................................................
..............................................................................................................................

iv) උපන් දිනය හා ස්ථානය :.......................................................................................

v) ජාතික හැඳුනුම්පත් අංකය :....................................................................................

vi) රාජකාරී ස්ථානය හා හා තනතුර :.......................................................................................
vii) දුරකථන අංකය (නිවස) ................. (ජංගම) :................. (රාජකාරී) :...................
viii) රජයේ අනුමත පත්වීම්ධාරී ගුරුවරයෙකු / රජයේ සේවකයෙකු ලෙස සේවා කාලය :...........................................................................................................

07. මාසික ආදායම :
අයදුම්කරුගේ සම්පූර්ණ වැටුප : රු. ..............................................
කලත්‍රයාගේ සම්පූර්ණ වැටුප : රු. ..................................................
වෙනත් ආදායම් ( සඳහන් කරන්න) : රු. .........................................
මුළු ආදායම : රු ......................................................................

08. බැංකු ගිණුම් :

| බැංකුවේ නම | බැංකු ශාඛාව | ගිණුම් අංකය | ගිණුමේ වර්ගය |
|---|---|---|---|
| ____________ | ____________ | ____________ | __________ |
| ____________ | ____________ | ____________ | __________ |

09. පවතින බැදීම් ණයකරුවෙකු/ඇපකරුවෙකු ලෙස

| බැංකුව | මුල් ණය මුදල | දැනට පවතින ණය මුදල | ඉදිරිපත් කරන ලද සුරැකුම | ණය ලබා ගත් හේතුව |
|---|---|---|---|---|
| ----------- | රු. --------- | රු. ------------- | ------------ | ------------ |
| ---------- | රු. --------- | රු. ------------- | ------------ | ------------ |

10. ඇමුණුම 03 අනුව ණය අයදුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියකියවිලි (මුල් පිටපත්)මේ සමග ඉදිරිපත් කරමි.

11. අයදුම්කරු පාලනය වන නීතිය :සාමාන්‍ය නීතිය/උඩරට නීතිය/තේසවලාමේ නීතිය/ මුස්ලිම් නීතිය

ආපදා ණය ලබා ගැනීමට අදාළ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 47/2017 හි විධිවිධානයන්ට හා බැංකුව විසින් අනුගමනය කරනු ලබන නීතිරීතිවලට යටත්ව ආපදා ණය මුදල ලබා ගැනීමට එකඟ වෙමි.

..............................
දිනය

...............................................
අයදුම්කරුගේ අත්සන

12 .ආධාර ලබන පෞද්ගලික පාසලක් වන ...............................................................විදුහලේ අනුමත පත්වීම්ධාරී ගුරුවරයෙකු ලෙස සේවය කරන........................................................... ස්වාමීන් වහන්සේ/ පියතුමා/කන්‍යාසොයුරිය/මහතා/මහත්මිය/මෙනවිය ට රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුභවතුන් සඳහා රජය විසින් ලබා දෙන ආපදා ණය ප්‍රතිලාභය ලබාදීම නිර්දේශ කරමි.

.........................................
දිනය

...........................
විදුහල්පතිගේ අත්සන හා නිලමුද්‍රාව

..............................................
දිනය

..............................................
පාසල් කළමනාකරුගේ අත්සන හා නිලමුද්‍රාව

13. ……………………………………………………………………(කලාප අධ්‍යාපන කාර්යාලයේ) ආයතන ශාඛාව විසින් සම්පූර්ණ කළ යුතුය.

1. මුල් පත්වීම් දිනය : ……………………………………………………………………………………
2. උපන් දිනය : ……………………………………………………………………………………………
3. ණය ඉල්ලුම් කරන දිනට වයස : ……………………………………………………………………
4. (අ) රජයේ ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසලක අනුමත ගුරු පත්වීමක්ද ?
   (ආ) එසේ නම් කවර දිනක සිට ද ?
5. රජයෙන් ලබාගෙන ඇති, ගෙවීමට ශේෂව තිබෙන ණය පිළිබඳ විස්තර :

| ණය වර්ගය | …………………දිනට ගෙවිය යුතු ණය ශේෂය |
|---|---|
| | |

6. මාසික වැටුප් විස්තරය :
   i. මාසික ඒකාබද්ධ වැටුප : රු. ……………………………………
   ii. දීමනා : රු.……………………………………………………
   iii. මුළු වැටුප : රු. ………………………………………………
   iv. මුළු අඩු කිරීම් (බැදීම්ගත අඩු කිරීම් සහිතව) : රු. ……………………………
   v. ශුද්ධ වැටුප : රු. ……………………………
   (අදාළ මාසයේ වැටුප් විස්තරය අමුණා ඇත)
   vi. අධ්‍යාපන අමාත්‍යාංශ 47/ 2017 චක්‍රලේඛයෙහි 06 වගන්තියේ විධිවිධාන පරිදි නිලධරයාට ලබා දිය හැකි උපරිම ණය මුදල දීමනා හැර මාසික ශුද්ධ වැටුපෙන් ණය මුදලේ වාරිකය හා සේවකයාගෙන් අය කරනු ලබන 4.0 % පොළිය යන කොටස් දෙකම අඩු කිරීමට හැකිවන ආකාරයට තීරණය කළ යුතුය .

(ඉලක්කමෙන් ……………………………………………………………)

(අකුරෙන් ………………………………………………………………)

7. ගුරුභවතාට විරුද්ධව නොවිසඳුන විෂමාචාර චෝදනාවක් හෝ දැනට විභාග වෙමින් පවතින විෂමාචාර චෝදනා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :
……………………………………………………………………………………………………………

……………………………  ……………………………………………………
දිනය  මාණ්ඩලික නිලධරයා (ආයතන)

<u>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :</u>

මගේ අංකය : ……………………………………
කලාප අධ්‍යාපන කාර්යාලය : ……………………………………

බැංකු කළමනාකරු
........................................බැංකුව
........................................ශාඛාව

රජය විසින් ලබා දෙන පොළී සහනාධාර මත ............................................................ ........................................................................................................මහතාට/මහත්මිය/මෙනෙවියට, ඔහුගේ/ඇයගේ ඉල්ලීම පරිදි ............................................................(කාර්යය) සඳහා මාසික වැටුපෙන් අය කර ගත හැකි මුදල අනුව පිරිනැමිය හැකි උපරිම ණය මුදල රු. ........................................................................................බව නිර්දේශ කරමි.

එසේම ඔහුගේ/ ඇයගේ වැටුපෙන් බැංකුවේ නිර්දේශ අනුව බැංකුව විසින් ගණනය කරනු ලබන ණය වාරිකය හා 4.0 % පොළිය ද සහිත නිලධරයාගෙන් අය කළ යුතු මාසික ණය වාරිකය හා එම මාසික ණය වාරිකයට ඇතුළත් වන රජය විසින් දරනු ලබන පොළී ප්‍රමාණය ණය වාරිකය සමග 9.1 වගන්තිය යටතේ මාසිකව බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට එකඟ වෙමි.

අත්සන :........................................
නම :............................................
තනතුර :........................................
නිල මුද්‍රාව : ....................................

ඇමුණුම 03

<u>ණය අයදුම්පත්‍රය සමඟ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ලියකියවිලි</u>

1. ජාතික හැඳුනුම්පත (මුල් පිටපත අනුව සහතික කරන ලද ඡායා පිටපත් දෙකක්).

2. අවසාන වැටුප් විස්තරය (සේවා යෝජකයා විසින් සහතික කරන ලද).

3. බැංකුව විසින් ඉල්ලා සිටින ලේඛන.

**සැ. යු.**

**ඉල්ලුම් කරනු ලබන ණය මුදලේ සම්බන්ධතාව අනුව අදාළ වන ලියවිලි පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.**

ඇමුණුම 4

<u>බැංකුව විසින් ණය මුදල නිදහස් කළ බව අදාළ</u>
<u>කලාප අධ්‍යාපන කාර්යාලයට දැන්විය යුතු ආකාරය</u>

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.......................................................................................කලාප අධ්‍යාපන කාර්යාලය

..........................................................................................................................

<u>ගේ ණය මුදල නිදහස් කිරීම.</u>

1. බැංකුව හා බැංකු ශාඛාවේ නම :..........................................................................

2. ණය හිමිකම් අංකය :..........................................................................

3. ණයලාභියාගේ සම්පූර්ණ නම :..........................................................................

..........................................................................................................................

4. (අ) ණයලාභියා දැනට දරණ තනතුර:..........................................................................

(ආ) ණයලාභියා අයත් සේවාව :..........................................................................

5. ලිපිනය පෞද්ගලික :..........................................................................

..........................................................................

රාජකාරී :..........................................................................

6. අනුමත කරන ලද ණය මුදල : රු. ..................................................(ඉලක්කමෙන්)

: රු.........................................................(අකුරෙන්)

7. ණය මුදල අනුමත කළ දිනය :..........................................................................

8. ණය අය කරනු ලබන කාල සීමාව :..........................................................................

.................................................... දින සිට .................................................... දින දක්වා

9. මාසික ණය වාරිකය

9.1 පොලිය සමග වාරිකයේ වටිනාකම : රු. ..........................................................

9.2 ගෙවිය යුතු මුළු වාරික ගණන : ..........................................................

දිනය :............................

.....................................

බැංකු කළමනාකරුගේ අත්සන

නම :.......................................

නිල මුද්‍රාව : ...............................

පිටපත් : ........................................................................................අධ්‍යාපන අමාත්‍යාංශය

........................................................................................(ණයකරු)